## විශ්වජිත් සන්දේශ් සූරියබණ්ඩාර

**සන්නස වෙනුවෙන්ම ලියන ආදරණීය ම නවකතාව**



# සිහිනයක් වගේ....

## 5

*පත්තරයේ මුල් පුවත ළඟ ඇගේ ඇස් නැවතුණි.*

*"ආරක්ෂක නිලධාරියාට පහර දුන් කෝටිපති පුතා රෝහලේ සැඟවෙයි"*

*ස්නේහා තුෂ්නිම්භූතව බලා සිටියා ය.*

"ඊළඟට කවුරු හරි අහිංසකයෙක් අල්ලගෙන තඩි බානවා.. ලොකු මිනිස්සුන්ගෙ මහන්තත්තකමට පොඩි මිනිස්සු පලි" ස්නේහා ඔහුගේ කතාවට එකතු කළා ය. ඔහු විමතියෙන් ඇය දෙස බැලුවේ ය. ඇගෙන් එවැනි කියමනක් ඔහු බලාපොරොත්තු නොවී ය.
"අහිංසකෙයොද නැද්ද මං දන්නෙ නැහැ.. මා එක්ක පැටලුනොත් මාත් අතාරින්නෙ නෑ.. එච්චරයි" ඒ පාර නම් දඩබ්බරයා එළියට පැන්නේ ය. ඔහුගේ ඇස් ඇතුළේ කෝපය ගිනිගන්නවා ඈ දුටුවා ය. තමන් අනවශ්‍ය දෙයක් කීවා නොනේදැයි ඈ පසුතැවිලි වුණා ය. මේ ලොක්කන් අස්සට පැනගෙන කතා කරන්නට යාම තමන්ට ගැළපෙන දෙයක් නොවේ යයි ඇයට සිතුණි. "රාත්තල් අස්සට අලුත්කාල් ගහන්න බෑ පුතේ" තාත්තා ළඟ හිටියා නම් නිසැකවම කියනු ඇත.

## ස්නේහාගේත් අකලංකගේත් කතාව



"ගමත් සර්ල හිතන තරම් සුන්දර නැහැ සර්" ස්නේහා කීවේ ඇත්තටම හිතුණ දේ ය. "පිටින් ඉඳලා බලන මිනිස-"සුන්ට පේන සුන්දරකම එතන නැහැ.. හරියට අපි නිවා-ඩුවට නුවරඑළියෙ ගියාම ඒ පරිසරය ලස්සනට දකිනවා වගේ. හැමදාම එහෙ ජීවත්වෙන මිනිස්සු කොයි තරම් කටුක ජීවිතද ගෙවන්නෙ.. සීතලේ නැහි නැහී.. හැම තිස්සෙම චුරු චුරු ගාගෙන වැටෙන පොද වැස්සට තෙමි තෙමී.. කඩං වැටෙ කඳු අස්සෙ පොඩි පොඩි ගෙවල් ඇතුළෙ ගෙවන ඒ ජීවිත නිවාඩුවට ගියාම අපි දකින්නෙ නෑනෙ සර්.. ඒ වගේ තමයි අපේ ගමේ ජීවිතත්.. ඒව හරිම කටුක ජීවිත සර්.."

අකලංක කල්පනා කරමින් සිටිනු ස්නේහාට පෙනෙයි. ඒ වෙලාවේ නම් අර චාපා කියූ දඩබ්බරයා ඔහු වෙතින් පලාගොස් ඇතුවා සේ ය.

"මගේ හිත හරිම කලබලයි ස්නේහා" අකලංක ඇඳෙන් බැස ස්නේහා සිටි තැනට පැමිණ ජනේලයෙන් ඉවත බලාගෙන කීවේ ය.

"ඉතිං මට කියන්නෙ මං මොනා කරන්නද?" ස්නේහා එසේ සිතුවා විනා ඇසුවේ නැත.

"මං ඉන්නේ සතුටෙන් නෙවෙයි... මට කරන්න ඒ හැටි වැඩක් නැහැ.. හැමදාම වගේ හවසට මං යාලුවො එක්ක ක්ලබ් ගානෙ යනවා.. කම්මැලිකමට.. පුරුද්දක් වෙලා දැං ඒක.. අපි කනවා බොනවා.. නටනවා.." ඔහු ඈත බලාගෙන කියවාගෙන යයි.